## 11. සුවසෙවන නිවාඩු නිකේතනය

කතරගම පුස්සදේව මාවතේ පිහිටි අප සමිතියේ අරමුදලින් ඉදි කරන ලද ‘‘සුවසෙවන’’ නිවාඩු නිකේතනය දිවයින තුල බෙහෙවින්ම ජනප්‍රිය වී පවතී. සාමාජිකත්වය සහ පොදු ජනතාවගේ සුභසාධනය පිණිස මෙම ව්‍යාපෘතිය 2003.02.23 දින ආරම්භ විය. වායුසමනය කල හා නොකළ සුවපහසු කාමර වලින් සහ නේවාසික ශාලා වලින් සමන්විත සුවසෙවන නිවාඩු නිකේතනය ඉතා සුන්දර පරිසරයක පිහිටා ඇත. සහන දායි වූ මිල ගණන් මත සේවාවන් සපයන බැවින් පොදු ජනතාවගේ ආකර්ෂණයට හා ප්‍රසාදයට පාත්‍ර ව ඇත. සමිතියේ සාමාජිකත්වය සඳහා සහන මිල ගණන් මත කාමර පහසුකම් ලබා ගත හැකි වන අතර සේවයෙන් විශ්‍රාම ලැබූ හිටපු සාමාජිකත්වය සඳහා සහන මිල ගණන් ක්‍රියාත්මක කිරීම විශේෂත්වයකි. සමිතියේ ලියා පදිංචි වීම තුළින් ඔවුන්ටම පහසුකම් ලබා ගැනීම තුල විධි විධාන සලසා ඇත.

‘‘සුවසෙවන’’ නිවාඩු නිකේතනය පිලිබඳ වැඩි දුර තොරතුරු සහ කාමර වෙන් කරවා ගැනීමේ පහසුකම suwasewan.hdts.lk යන වෙබ් පිටුව හරහා ඔබට පහසුවෙන් සිදු කර ගත හැකිවේ.